# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2392/35 – 2024 ජූලි මස 10 වැනි බදාදා – 2024.07.10**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත 1 ඡේදයේ විස්තර කරනු ලබන පරවශතාවය, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම මෙයින් ප්‍රකාශ කරමි. එකී පරවශතාවය අත්කර ගනු ලබන්නේ කවර ඉඩමකින්ද යන්න 2 ඡේදයේ විස්තර වේ.

1. **පරවශ්‍යතාවේ විස්තරය.**– අඹතලේ කැළණි ගඟ හරහා ඉදිකරන ලද ලවන බාධකයට හා නිල නිවාස සඳහා ප්‍රවේශ මාර්ගය ඉදිකර ඇති ඉඩම් කොටසේ පරවශ්‍යතා අයිතිය අත්කර ගැනීම.

2. **ඉඩමේ විස්තරය.**– බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අධිකාරි පත්තුව සුළු කොට්ඨාසයේ, 278 ඒ බොල්ලෑගල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බොල්ලෑගල ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක GA/BIY/2019/226 හා 2019.05.31 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් සහ ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කැබැල්ලට මායිම්:

01. කැබලි අක්ෂර **'A'** – පැලවත්ත – ප්‍රමාණය**:** හෙක්. 0.1381

උතුරට: පාර, ඉඩමේ නම සහ හිමිකරු සොයාගත නොහැකි ඉඩම, සෝමලතා ගුණවර්ධන හිමිකම් කියන වගුරු බිම සහ පැලවත්ත; නැගෙනහිරට: ඉඩමේ නම සහ හිමිකරු සොයාගත නොහැකි ඉඩම, සෝමලතා ගුණවර්ධන හිමිකම් කියන වගුරු බිම සහ පැලවත්ත; දකුණට: සෝමලතා ගුණවර්ධන හිමිකම් කියන පැලවත්ත; බටහිරට: ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හිමිකම් කියන ඉඩම, සෝමලතා ගුණවර්ධන හිමිකම් කියන පැලවත්ත, එන්. ඒ. ආර්. පාලිත හිමිකම් කියන වගුරු බිම සහ ඉඩමේ නම සහ හිමිකරු සොයාගත නොහැකි ඉඩම.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/18/2018/WS/447.
2024 පෙබරවාරි මස 07 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 07 – 0091/1

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මගේ අංකය: 4-3/18/2018/WS/447.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය:
බිය/3/1/1/504.

1972 අංක 18 සහ 1974 අංක 29 දරන අර්ථ නිරූපණ (සංශෝධිත) පනත්වලින් සංශෝධිත අර්ථ නිරූපන ආඥාපනතේ (12 වන අධිකාරය) 18 වන වගන්තිය ප්‍රකාරව සංචාරක හා ඉඩම් අමාත්‍ය නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම අංක 2341/32 හා 2023.07.19 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 1A පිටුවෙහි භාෂාත්‍රයෙන් පළ කරන ලද 5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය මෙයින් අවලංගු කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

2024 පෙබරවාරි මස 07 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 07 – 0091/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.